# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2234/6 - 2021 ජූනි මස 29 වැනි අඟහරුවාදා - 2021.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දේශීය ආදායම් පනත**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, 2020 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ තුන්වන උපලේඛනයේ (ද) ඡේදයේ (ii) වන උපඡේදයේ සඳහන් කාර්යයන් සඳහා මෙම ගැසට් පත්‍රයේ උපලේඛනයේ II වන කොටසේ සඳහන් කොන්දේසිවලට යටත්ව, එම උපලේඛනයේ I වන කොටසේ සඳහන් කර ඇති තොරතුරු තාක්ෂණය සහ සඵල සේවා නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 ජූනි මස 29 වැනි දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

I වන කොටස

1. යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ කරනු ලබන මෘදුකාංග සංවර්ධන සේවාවන්.

2. ශ්‍රී ලංකාවේ සංවර්ධනය කරනු ලබන ඕනෑම වර්ගයක මෘදුකාංගයකට අදාළ අනුකූලනය (adaptation), තිබෙන තත්ත්වයෙන් උසස් කිරීම (upgrading), වැඩි දියුණු කිරීම (enhancement), ක්‍රියාත්මක කිරීම (implementation) සහ ඒ හා සමාන සේවාවන්.

3. යම් දේශීය ආයතනයක් විසින් යම් තැනැත්තෙකුට සපයනු ලබන පහත සඳහන් සේවාවන් :-

   (අ) පරිගණක වැඩසටහන්කරණ සේවා;
   (ආ) ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ යෙදුම් පිහිටුවීම (deployment of business Information Technology applications);
   (ඇ) පද්ධති ඒකාබද්ධකරණය (system integration);
   (ඈ) වෙබ් අඩවි සංවර්ධනය සඳහා වන සේවාවන්;
   (ඉ) මාර්ගගත වේදිකා (online platforms) සංවර්ධනය සඳහා වන සේවාවන්;
   (ඊ) ජාල ඒකාබද්ධකරණය (network integration);

(උ) දත්ත ගවේෂණ (data mining) සහ දත්ත පරිපාලන සේවාවන් සඳහා දත්ත සැකසීම;
(ඌ) දේශීය වලාකුළු සේවා (local cloud services);
(එ) කෘත්‍රිම බුද්ධිය;
(ඒ) සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලය (Internet of Things); සහ
(ඔ) සයිබර් ආරක්ෂාව.

4. ඉලෙක්ට්‍රොනිකව හෝ පරිගණක පද්ධතියක් භාවිතයෙන් හෝ ජංගම ඉලෙක්ට්‍රොනික උපාංග භාවිතයෙන් යම් දේශීය ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තෙකු විසින් යම් තැනැත්තෙකුට පහත සඳහන් පසු අන්ත (back-office) සේවා සැපයීම -

(අ) දුරස්ථ තොරතුරු තාක්ෂණ නඩත්තුව;
(ආ) දත්ත සෙවුම් ඒකාබද්ධ කිරීම සහ විශ්ලේෂණය (data search integration and analysis);
(ඇ) සායනික අත්හදාබැලීම් හැර සායනික දත්ත සමුදා කළමනාකරණ සේවා; සහ
(ඈ) තොරතුරු තාක්ෂණ සේවා බාහිරකරණය (Information Technology service outsourcing).

5. (අ) භූගෝලීය තොරතුරු පද්ධතිය;
(ආ) ඉංජිනේරු සහ නිර්මාණ සේවා; සහ
(ඇ) සජීවීකරණ හෝ අන්තර්ගත සංවර්ධන හා කළමනාකරණයට අදාළව

දැනුම හා උසස් විශ්ලේෂණාත්මක සහ තාක්ෂණික කුසලතා යෙදවීම අවශ්‍ය වන තොරතුරු තාක්ෂණය ප්‍රධාන වශයෙන් සහාය කර ගනිමින් හෝ යොදා ගනිමින් දැනුම් සැකසුම් බාහිරකරණ සේවා (knowledge process outsourcing services) සැපයීම.

II වන කොටස

1. 2020 අප්‍රේල් 1 සිට ක්‍රියාත්මක වන පරිදි, තොරතුරු තාක්ෂණයට අදළ දේශීය තාක්ෂණික සේවකයින්ගේ සංඛ්‍යාව, I වන කොටසේ, එක් එක් අවස්ථාව අනුව, I වන අයිතමයේ සඳහන් මෘදුකාංග සංවර්ධනයෙහි නිරතව සිටින හෝ 2 වන අයිතමයේ සඳහන් සේවාවන් සපයන එවැනි සමුච්චිත සේවක සංඛ්‍යාවෙන් සියයට හැත්තෑවකට (70%) නොඅඩු විය යුතු ය.

2. 2020 අප්‍රේල් 1 සිට ක්‍රියාත්මක වන පරිදි, 1 වන කොටසෙහි 1 වන හා 2 වන අයිතමවල සඳහන් සේවාවන් හැර එම කොටසෙහි සඳහන් සේවාවන් සම්බන්ධයෙන්, අවම ''දේශීය අගය එකතු කිරීම'' එවැනි සේවාවන්හි දළ ආදයමෙන් සියයට පනහකට (50%) නොඅඩු විය යුතු ය.

''දේශීය අගය එකතු කිරීම'' ගණනය කිරීම සඳහා, එවැනි තැනැත්තෙකු විසින් ආනයනය කරන ලද හෝ දේශීයව මිලදී ගත් නමුත් ආනයනය කරන ලද යම් භාණ්ඩවල පිරිවැය හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තෙකුට යම් සේවාවක් සඳහා ගෙවනු ලබන පිරිවැය, එවැනි සේවාවන්හි දළ ආදායමෙන් අඩු කරනු ලැබේ.

3. මෙම නිවේදනය ක්‍රියාත්මක වන දිනට පවත්නා ව්‍යාපාරයක් කැඩීමෙන් (splitting-up) පිහිටුවන ලද හෝ ඇතිකරන ලද ඕනෑම ව්‍යාපාරයක් සුදුසුකම් නොලබයි.

07 - 357

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.